# දකුණු විලච්චි කෝරළයේ නොච්චියාගම කොට්ඨාසයේ පහළ හල්මිල්ලෑව ග්‍රාමීය වැව ආශ්‍රිත තාක්ෂණය පිළිබඳ අධ්‍යයනක්

ඒ.එම්.ජී.එච්.එම්. හේමාතිලක

පුරාවිද්‍යාව හා උරුම කළමණාකරන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
Hasankamadumali123@gmail.com

**මුඛ්‍ය පද** - වැව, කෝරළය, තාක්ෂණය, ජලය, ඇඳතු වැව්

## හැඳින්වීම

ජලය රැස්කර රඳවා තබා ගනිමින් අවශ්‍ය විට කෘෂිකර්මාන්තය සහ විවිධ අවශ්‍යතාවයන් උදෙසා එම රැස්කරගත් ජලය යළි නිකුත් කළ හැකි මානව නිර්මිතය, වැව නමින් හැඳින්වේ (විතානාච්චි, 2017:52). ජනගහනය වර්ධනය වීමත් සමගම නාගරීකරණය, වාණිජ කටයුතු දියුණුවීම වැනි සමාජීය හේතූන් මත ගම් වැව් පද්ධතිය අඩපණ වීම නිසා එයට ඔරොත්තු දීම සඳහා වඩාත් පුළුල් වැව් තැනීම ආරම්භ වී ඇත (විතානගේ, 2004:67-68). මෙවැනි වැව් හුදෙකලා වැවක් ලෙස කළාතුරකින් හමු වුවද පොදුවේ ගත් කළ බොහෝ මහ වැව් කුඩා ගම් වැව් කිහිපයක් හෝ වැව් පද්ධතියක් සේ එකිනෙකට බැඳී පවතී.

මෙලෙස එකිනෙකට බැඳී සම්බන්ධවන පරිදි පෝෂණ රටාවකින් යුතු වැව් සමූහය හෙවත් වැව් පද්ධතිය ඇඳතු වැව් ලෙස හැඳින්විය හැක. මේ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වන්නේ දකුණු විලච්චි කෝරළයේ ග්‍රාමීය වැව් අතර පහළ හල්මිල්ලෑව වැව ආශ්‍රිතව අතීතයේ පටන් මහවැලි ව්‍යාපාරය පැමිණීම දක්වා කාලය තුළ සිදුව ඇති තාක්ෂණික වෙනස්කම් කොතෙක් ද එය සිදු වූයේ කෙසේද යන්න විමර්ශනය කිරීමයි. එසේම පහළ හල්මිල්ලෑව වැවෙහි තාක්ෂණය අතීතයේ පටන් වර්තමානය දක්වා පැවත එන ආකාරය අධ්‍යයනය කිරීමද මූලික අරමුණ කර ගනිමින් පර්යේෂණය සිදු කරන ලදී.

## ක්‍රමවේදය

අධ්‍යයනයේ අරමුණු සාධනයට අදාළ තොරතුරු එක් රැස් කොට ගැනීමේ ක්‍රමවේදයන් ලෙස ක්ෂේත්‍ර ගවේෂණය හා සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු ලබාගත් අතර අධ්‍යයනය සම්බන්ධව කිසිදු පූර්ව අධ්‍යනයක් සිදුව නොමැති වුවද මීට පෙර සමස්ථ ග්‍රාමීය වැව් පද්ධතිය අලලා ලියැවී ඇති සාහිත්‍යමය මූලාශ්‍රය අධ්‍යයනය මඟින් ද යම් අවබෝධයක් ලබා ගැනීම සිදු කොට ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

දකුණු විලච්චි කෝරළය උතුරු මැද පළාතේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වපසරිය තුළ 350 තුළානයේ පහළ හල්මිල්ලෑව මහ වැව පිහිටා ඇත. අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන මෙම වාරි නිර්මිතය කුඩා වැව් 17 කින් යුතු ඇඳතු වැව් පද්ධතියක ජල ධාරිතාවය දරා සිටින ප්‍රධාන මහ වැව වේ. කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටගෙන විවිධ අවශ්‍යතාවයන් උදෙසා ජලය ගබඩා කර ගැනීමේ පර්මාර්ථයෙන් නිර්මාණය වී ඇති පහළ හල්මිල්ලෑව වැවෙහි ප්‍රධාන ජල සම්පාදන ක්‍රමවේද ලෙස, වර්ෂාවෙන්, ආගර දිය පහරින්, ඇළ මාර්ග මඟින් ජලය ලබා දීම සිදුව ඇත. 1980 වර්ෂයේ මහවැලි ව්‍යාපාරය පැමිණීමෙන් අනතුරුව ඇළ මාර්ග මඟින් ද ජලය ලබා දීම මූලික සිදු වූ අතර ඒ වන තෙක් ඇඳතු වැව් පද්ධති මඟින් ජලය ලබා ගෙන ඇත. මෙම වැව වැව් කොටු ලෙස හැඳින්විය හැක. දිවියා බැන්ද වැව, ඉහළ කොඩිතුවක්කුව වැව, පහළ කොඩිතුවක්කුව වැව, ඉහළ වැව, දෙමට වැව, තරණගොඩ වැව, ඉහළ හල්මිල්ලෑව වැව, දුම්බුළු වැව ආදියෙන් ද ජලය සපයා ගෙන ඇත. මීට අමතරව කඩවල, ඔබ්‍රියා වල, දංකද වල, ගුරු වල, ගොඩ වල, බොර වල මඟින් ජලය සපයාගෙන ඇත.




මෙම ආශ්‍රිත තාක්ෂණික අංග හා ක්‍රමවේද පිළිබඳ විමසා බැලීමේ දී වැවට ලැබෙන ජලයේ පීඩනය දරාගනු ලබන වැ කන්දෙහි වර්තමාන දිග කිලෝමීටර් 1ක් හා 800 මීටර් වේ. මුල් කාලයේ අඩි 4 හෝ 5 පමණ තිබූ අතරම 1956 වසරේදී මෙම වැ කන්ද ශක්තිමත් භාවයෙන් අඩුවීම මත හතර පොළකින් කැඩී යෑම සිදුව ඇත. 1957 වසරේදී නැවත එම වැ කන්ද කැඩී යාම මත අඩි 100න් 100ට ගල් කණු එහි අභ්‍යන්තරයට දමා 1982 දී මහවැලි ව්‍යාපාරය හමුවේ නිර්මාණය කොට ඇත.

වැ බැම්මට ඇතිවන පීඩනය හා ඛාදනය වළකාලන වැ රළපනාව යන අංගය 1983 වසරේ දී නිර්මාණය වී ඇත. වර්තමානය දක්වා එම කළුගල් ඇතිරුම දැකගත හැක. මුල් කාලවකවානුවේ බෙණ සහිත විශාල ශාක කොට මඟින් සොරොව් පිහිටා තිබී ඇති අතර ම පසු කාලයේ මැටි සොරොව් පහක් නිර්මාණය කොට ඉන් අනතුරුව ගොඩ, මැද, මඩ සොරොව්ව වශයෙන් සොරොව් දෙකක් නිර්මාණය වී ඇත. මහවැලි සංවර්ධනයෙන් පසුව සොරොව් දෙකක් දක්නට ලැබේ.

වැවේ ජලය පිටකොට වැවේ ආරක්ෂාව තහවුරු කරන පිටවාන දෙකක් මෙම වැවෙහි තාක්ෂණික අංග අතර කැපී පෙනෙන ලක්ෂණයක් වන අතර වැවේ වම්පස වාන අඩි 100 අගල් 06 උසින් ස්වාභාවික උස් බිමක් උපයෝගී කොටගෙන පිහිටි ගල මත ද, දකුණුපස වාන අඩි 200 අගල් 06ක් පහතිනුත් ස්වාභාවික පාෂාණ ස්ථර දෙකක් යා කොට ඇත. මෙම වාන් අඩි 200ක උසින් යුතුය.

වැවෙහි පවතින වතුර ප්‍රමාණය නිගමනයට සිටවූ දියකැට පහනක නටබුන් වැව සිඳී යන විට පැරණි මඩ සොරොව්ව ආශ්‍රිතව දැකගත හැකි. පහළ හල්මිල්ලෑව වැව ආශ්‍රිතව දක්නට ලැබෙන අනෙක් තාක්ෂණික අංග අතර වැවට ජලය ලැබෙන ප්‍රදේශ වන වැව් පිටියට වඩා විශාල ප්‍රදේශයක වැව් ඉහත්තාව පැතිරී එය ඈඳතු වැව් ආශ්‍රිතව ඉහළින් ඕලු වැව, පහළ වැටියාව වැව දක්වා දිවයයි. වැව් තාවුල්ල අතීතයේ පටන් මේ දක්වාම ගොඩ හේන් ක්‍රමයට හා ගොඩ කුඹුරු ක්‍රමයට වගා කෙරේ. මෙම වැව සතුව විශාල ප්‍රදේශයක වැව් පිටිය පැවත ඇති අතර වර්තමානය වන විට එය ප්‍රමාණයෙන් කුඩා වී ඇත. වැව නිර්මාණයේ දී මුල් කාලයේ පස් කපා ඇත්තේ වැව ඇතුල් පැත්තෙන් කට්ට භාගයක් හා වැවේ පිට පැත්තෙන් කට්ටා එකක් වශයෙනි. එම පස් කැපූ වල පිට වල කට්ටකාඩුව වේ. මෙම වැව ආශ්‍රිතව ඉතා දිගු හා ගැඹුරු කට්ටකාඩුවෙහි එක් වළක් "නල්ලුවාගේ වල" නමින් හැඳින්වේ. වැව සිඳී යන විට වතුර ඉතිරි වන්නේ මීක්ගහ වලෙහි හා පලුගහ වලෙහි ය. මහ මංකඩ, ගොඩ මංකඩ ද වර්තමානය දක්වා පවතී.

පුරාණ ලංකාවේ වාරි තාක්ෂණය තරම් පුළුල් වූත් සංකීර්ණ වූත් ශිල්පීය ඥානයෙන් විශිෂ්ඨ වූ වාරි තාක්ෂණය දකුණු ආසියාවේ තිබූ ප්‍රදේශයක බිහිව ඇති බව පැහැදිලි කරුණකි. ඒ අතරින් තිරස් ජාලගත හෙවත් ඈඳතු වැව් පද්ධතිය මඟින් පෝෂණය වන මහ වැව්

ප්‍රධානතම වාරි නිර්මිත වන අතර මෙම වාරි නිර්මිතයන් අතරින් දකුණු විලච්චි කෝරළයේ පහළ හල්මිල්ලෑව මහ වැව ආශ්‍රිත තාක්ෂණය අනෙක් වැව් අතරින් ප්‍රධාන තැනක් හිමි කර ගනු ලබන අතර, අතීතයේ පටන් වර්තමානය දක්වා විවිධ වෙනස්කම්වලට ලක් වී ඇති බවත්, වැවේ ඇතැම් අංගයන් ආක්‍රමණික ශාකවල බලපෑම මත අභාවයට යෑමත් දක්නට ලැබෙන බවද මෙම අධ්‍යයනයේ දී පැහැදිලිව දක්නට ලැබේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

විතානාච්චි, සී.ආර්. (2017), ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය,*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විතානගේ, අයි. (2004), ***හාස්කම් පිරි සිංහල වැව,*** මිත්‍ර ප්‍රකාශන,

**සම්මුඛ සාකච්ඡා**

කෙහෙල් පන්නල ගෙදර සරත්චන්ද්‍ර, (අවුරුදු හැට පහයි), 2023.06.16

පුංචි බංඩාගේ නිමල් බණ්ඩාර, (අවුරුදු හැට එකයි), 2023, 06, 16

ඩී.බී. පියසේන, (අවුරුදු හැත්තෑ හතයි)